# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2367/08 – 2024 ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 නොවැම්බර් මස 07 වැනි දින අංක 1887/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 308 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/324 - II.
ඉඩම් අත්කරගැනීමේ නිලධාරීගේ අංකය. : WGSWD&EIP/ACQ/KB/16.

2024 ජනවාරි මස 04 වැනි දින
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක. 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 576A - තුම්බෝව්ල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්බෝව්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 521203 හා 2016.05.23 දිනැති කැඩැස්තර සිතියමේ කලාප අංක 17න් 02 කලාපය, පත්‍ර අංක 04 හි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 487 – ඔරුවල ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0651
උතුරට: කැබලි අංක 485 සහ 74; නැගෙනහිරට: කැබලි අංක 74 සහ 488; දකුණට: කැබලි අංක 488, 489 සහ 490; බටහිරට: කැබලි අංක 486.

EOG 01 - 0127



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මෙම කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටසෙහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/324 - II.
ඉඩම් අත්කර ගැනීමේ නි. අං.: WGSWD&EIP/ACQ/KB/16.
2024 ජනවාරි මස 04 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 576B - තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුම්බෝවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 521203 හා 2016.01.15 දිනැති කැඩැස්තර සිතියමේ කලාප අංක 18න් 06 කලාපය, පත්‍ර අංක 05 හි සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 426 – අඹගහඹිවිට – ප්‍රමාණය: හෙක්. 0.0526**
උතුරට: කලාප අංක 7 කැබලි අංක 91 සහ කැබලි අංක 425; නැගෙනහිරට: කැබලි අංක 425 සහ 4; දකුණට: කැබලි අංක 20,19 සහ 29; බටහිරට: 27 සහ 25.

EOG 01 - 0128

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2306/74 හා 2022.11.18 වැනි දින දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2022 අංක 156 හා 2022.11.11 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මෙම කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2306/74 හා 2022.11.18 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2022 අංක 156 හා 2022.11.11 වැනි දින දරන ආඥාව අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/95.
ඉඩම් අත්කර ගැනීමේ නි. අං.: WGSWD&EIP/ACQ/DW/03.
2024 ජනවාරි මස 04 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහුවල (දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2015/550 හා 2015.09.16 දිනැති අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 08 – කොටුවේ කුඹුර සහ ප්‍රියන්කරයාගේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1640**
උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 7 සහ 1; නැගෙනහිරට: මෙල්ඩර් පෙදෙසේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 10 සහ 9; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 9, සුනේත්‍රා දේවී පාරේ වරිපනම් අංකය 65/2 දරන ඉඩම, සුනේත්‍රා දේවී පාරේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම, පාර, සුනේත්‍රා දේවී පාරේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම, සුනේත්‍රා දේවී පාර වරිපනම් අංකය 57/1A දරන ඉඩම.

EOG 01 - 0129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.